# තල්පතේ පිළියම් ග්‍රන්ථ මාලාව තුළ ඇතුළත් කුෂ්ඨ රෝග සඳහා පොදු වශයෙන් යොදා ගන්නා ප්‍රලේප වට්ටෝරු පිළිබඳ සාහිත්‍ය විමර්ශනයක්

නුවන්සිරි එල්. එස්. බී.[1], අබේසූරිය එස්. ආර්.[2]
[1]චිකිත්සා අධ්‍යනාංශය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.
[2]ද්‍රව්‍යගුණ අධ්‍යනාංශය, ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යායතනය, කැලණිය විශ්වවිද්‍යාලය, යක්කල.

**සංක්ෂිප්තය**

මිනිසාගේ මනසත් ගතත් අතිශය පීඩාවට පත් කරන රෝග අවස්ථාවක් ලෙස චර්ම රෝග හෙවත් කුෂ්ඨ රෝග දැක්විය හැක. ඊට හේතුව මෙය චර්මය ආශ්‍රිත ව හටගන්නා බැහැරින් දර්ශනය වන රෝගයක් බැවින් පුද්ගල පෞරුෂය බිඳ වැටීමට හේතු වේ. එමනිසා කුෂ්ඨ චිකිත්සාව පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් ය. වර්තමානයේ කුෂ්ඨ රෝග චිකිත්සාවේ දී බොහෝ වෛද්‍යවරුන් ප්‍රලේප වට්ටෝරු කිහිපයකට පමණක් සීමා වී ඇති අතර ඇතැම්විට එම ප්‍රලේප වට්ටෝරු සඳහා ඇතැම් රෝග ප්‍රතිරෝධතාවක් දක්වන අතර ඇතැම් ප්‍රලේප වට්ටෝරු සඳහා ඇතැම් රෝගීන් ආසාත්මිකතා දක්වයි. එහෙයින් කුෂ්ඨ රෝග සඳහා නව ප්‍රලේප වට්ටෝරු හඳුනාගැනීම හා අධ්‍යයනය ඉතා වැදගත් වේ. මේ සඳහා දේශීය ඖෂධ වට්ටෝරු රාශියකින් සමන්විත තල්පතේ පිළියම් ග්‍රන්ථ කාණ්ඩය ආශ්‍රය කර දත්ත විශ්ලේෂණය කරන ලදී. දත්ත විශ්ලේෂණය සැලකීමේ දී කුෂ්ඨ රෝග සඳහා යොදා ගන්නා උද්භිද ද්‍රව්‍ය 66ක් ද පාර්ථිව ද්‍රව්‍ය 11ක් ද ජාන්තව ද්‍රව්‍ය 02ක් ද හඳුනාගැනුණි. උද්භිද ද්‍රව්‍ය 66 අතුරින් බහුල වශයෙන් භාවිත වන්නේ මඟුල්කරඳ ශාකයේ කොටස් ය. එය 27.85%කි. 26.58% තෝර ශාකයේ කොටස් ද 20.25% වලඟසාල් ශාකයේ කොටස් ද 18.99% කොහොඹ ශාකයේ කොටස් ද 17.72% ඇහැළ ශාකයේ කොටස් ද 17.72% කහ ශාකයේ කොටස් ද 13.92% ගම්මිරිස් ශාකයේ කොටස් ද 12.66% අරළු ශාකයේ කොටස් ද 11.39% තල ද භාවිත වේ. මෙම ග්‍රන්ථගත වට්ටෝරු තුළ බහුල ව භාවිත කර ඇත්තේ බීජ වර්ග යි. බීජ වර්ග 24ක් වට්ටෝරු තුළ අඩංගු විය. පත්‍ර වර්ග 21ක් ද මුල් වර්ග 16ක් ද පොතු වර්ග 5ක් ද රෛසෝම වර්ග 8ක් ද ඵල වර්ග 7ක් ද කඳන් වර්ග 4ක් ද නිර්යාස වර්ග 03ක් ද ක්ෂාර වර්ග 03ක් ද ක්ෂීර වර්ග 3ක් ද ඇතුළත් විය. ජාන්තව ද්‍රව්‍ය ලෙස මිනිස් හිස් කබලේ අළු හා මොණර පිල් පමණක් 02.53%ක ප්‍රතිශතයකින් අඩංගු වේ. පාර්ථිව ද්‍රව්‍ය ලෙස සහිඳලුණු 24.05%, මනෝසිල 12.66%, ගන්ධක 08.8%, වියන් දුඹුලු 03.79%, රසදිය හා පුෂ්කර 02.53% යන ප්‍රතිශතවලින් අඩංගු වන අතර පල්මානික්කම්, ක්ෂාර ලුණු, නවසාරං, යහුණු, වෙඩිලුණු 01.27%කින් අඩංගු වේ.

**ප්‍රමුඛ පදඃ** කුෂ්ඨ, ප්‍රලේප, තල්පතේ පිළියම්

**විද්‍යුත් ලිපිනයඃ** buddhikanuwansiri1987@gmail.com